සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 32 | S | II |
|---|---|---|

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016

**Third Term Test - Grade 13 - 2016**

විභාග අංකය ............................

# ව්‍යාපාර අධ්‍යයනය II

කාලය පැය තුනයි

උපදෙස්

♦ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් වත් තොරාගෙන ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

## I කොටස

(1) (i) ලාභ ලැබීමේ අරමුණින් හෝ ලාභ අරමුණින් තොරව පවත්වා ගෙන යන මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය අලෙවිය හා අනුබද්ධ සියළු කටයුතු ව්‍යාපාර වේ. ව්‍යාපාර සංකල්පයට ඇතුලත් පහත සඳහන් පද පැහැදිලි කරන්න.

(අ) නිෂ්පාදිතය (ආ) වටිනාකම හා තෘප්තිය

(ඉ) හුවමාරුව හා ගණුදෙනු (ඊ) වෙළඳපොල (ලකුණු 04 යි)

(ii) ව්‍යාපාරවල දියුණුවත් සමඟ වර්තමානයේ විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් ව්‍යාපාර සංකල්ප බිහිවී තිබේ.

(අ) විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් ව්‍යාපාර යන සංකල්ප වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) වෙළඳාම, වාණිජ්‍යය, කර්මාන්ත, ව්‍යාපාර, හා විද්‍යුත් ව්‍යාපාර අතර පවතින සම්බන්ධතාව ගැලීම් සටහන කින් දක්වන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ශ.දු.අ.ත. විශ්ලේෂණය යොදාගනිමින් කෙරෙන පරිසර විශ්ලේෂණයන් තුලින් ව්‍යාපාරිකයෙකුට ලැබිය හැකි ප්‍රතිලාභ මොනවාද? (ලකුණු 02 යි)

(ආ) අපද්‍රව්‍ය කළමණාකරණය උදෙසා පාරිභෝගික ජනතාවට දායකවිය හැක්කේ කෙසේදැයි දක්වන්න. (ලකුණු 02 යි)

(iv) (අ) සත්‍ය දෑ පමණක් සන්නිවේදනය කිරීම යන ව්‍යාපාර ආචාර ධර්ම සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදනයට අදාල ආචාර ධර්ම පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) සමාජ වගකීම් ගැන සැලකිලිමත් වීමේදි ව්‍යාපාරයක් අවධානය යොමු කලයුතු පාර්ශව 04 ක් නම් කරන්න. (ලකුණු 02)

(ආ) ඇල්ම ඇති පාර්ශවයන්ට ව්‍යාපාර සමාජ වගකීම් සංකල්පයෙන් අත්වන වාසිදායක තත්වයන් මොනවාද? (ලකුණු 02)

(2) (i) (අ) අන්තර්ජාතික පාරිබෝගික සමිති සම්මේලනය විසින් ප්‍රකාශයට පත් කරන ලද පාරිබෝගික අයිතිවාසිකම් 4ක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) පාරිබෝගික ආරක්ෂාව සඳහා ගෙන එන ලද පාරිබෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත දක්වා එම පනතින් අහෝසි කරන ලද පනත් 03 දක්වන්න. (ලකුණු 02 යි)

(ii) (අ) පේටන්ට් (patent) යනු කුමක්දැයි හඳුන්වන්න? (ලකුණු 02 යි)

(ආ) බුද්ධිමය දේපල සුරැකීම යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02 යි)

(iii) (අ) HACCP ප්‍රමිතිය හඳුන්වන්න (ලකුණු 02 යි)

(ආ) ශ්‍රී ලංකාවතුළ ප්‍රමිති ක්‍රියාත්මක වන ක්‍රම 04 ක් දක්වන්න. (ලකුණු 02 යි)

(iv) ප්‍රදේශයේ ජනප්‍රිය මෝටර් රථ කාර්මික ශිල්පියෙකු වූ සුදර්ශන මෝටර් රථ පින්තාරු කරුවකු වන නන්දන හා පැස්සුම් කරුවකු වන අජිත් සමග එකතු වී තම ව්‍යාපාරය පුළුල් ලෙස ශක්තිමත් පදනමක් යටතේ හවුලක් ලෙස පිහිටුවා ගත්හ.

(අ) කේවල ස්වාමි ව්‍යාපාරයක් ලෙස ඉතා සාර්ථකව ගෙන ගිය ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් කිරීමට සුදර්ශන කැමති වීමට පදනම් විය හැකි කරුණු හතරක් ඉදිරිපත් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ඉහත පරිවර්තනය නිසා සුදර්ශනට අත්විඳීමට සිදුවිය හැකි අහිතකර ප්‍රතිඵල හතරක්පෙන්වා දෙන්න. (ලකුණු 02 යි)

(v) (අ) 2007 අංක 07 දරණ සමාගම් පණත යටතේ දක්වා ඇති පරිදි සීමා සහිත පොදු සමාගමක අවම කොටස් කරුවන්ගේ සංඛ්‍යාව 1 කි. එහෙත් එම පණතෙහි දක්වා ඇත්තේ අධ්‍යක්ෂවරු අවමය දෙදෙනෙක් සිටිය යුතු බවයි. මෙහිදී සමාගම ක්‍රියාකලයුතු ආකාරය පිළිබඳව නිතියට අනුකූලව ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) එක් පුද්ගලයෙකුට වුවද සමාගමක් ආරම්භ කිරීමට අවස්ථාව ලබාදීම තුලින් රජය අපේක්ෂා කරන අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(3) (i) ව්‍යවසායකයින්ට පොදු වූ ප්‍රධාන ගති ලක්ෂණ අටක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) කුඩා ව්‍යාපාර දිරිමත් කිරීම උදෙසා මූල්‍ය පහසුකම් ලබාදීමට ක්‍රියාත්මක රාජ්‍ය අංශයේ නොවන යෝජනා ක්‍රම 2 නම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) කුඩා ව්‍යාපාර සංවර්ධනයට ශ්‍රී ලංකා රජය දැනට ලබාදෙන සානු බලයන් කවරේද? (ලකුණු 02 යි)

(iii) ව්‍යවසායකත්වයෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට අත්විය හැකි ප්‍රතිලාභ 4 ක් සඳහන් කර වැදගත් කම පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) වාණිජ බැංකු විසින් ආයෝජකයන්ට සහ සාමාන්‍ය මුදල් තැන්පත් කරුවන් සඳහා ආකර්ශණිය තැන්පතු ක්‍රම හඳුන්වා දෙමින් පවති. කෙසේ වුවත් එම සියලු ගිණුම් ප්‍රධාන කොටස් කිහිපයක් යටතේ වර්ගකර දැක්විය හැක. ඒවා මොනවාදැයි නම්කර පැහැදිලි කරන්න. (ලකුණු 2 යි)

(ආ) වාණිජ බැංකුවක ප්‍රධාන කාර්යක් වනුයේ ණය සැපයීමයි එහිදි බැංකු ණයක් යන්නෙන් කුමක් අදහස් කරන්නේ දැයි දක්වා වාණිජ බැංකුවක් විසින් ලබාදෙන සාමාන්‍ය ණය ප්‍රධාන කොටස් 2 කට වර්ග කර දක්වා ඒ මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) විද්‍යුත් මුදල් භාවිතා කිරීමේදි විවිධ පාර්ශව කිහිපයක් සම්බන්ධ විය යුතුය. එම පාර්ශ්වයන් කව්රුන්දැයි සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ණය කාඩ්පත් භාවිතා කිරිම තුලින් ගණුදෙනු කරුට හා ව්‍යාපාරිකයාට සිදුවන අවාසි 2 ක් බැගින් දක්වන්න. (ලකුණු 02 යි)

(4) (i) (අ) මුහුදු උවදුරු රක්ෂණ ඔප්පු ප්‍රධාන වර්ග දෙකකට බෙදේ. එම වර්ග දෙක නම්කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) කෙටි සටහන් දෙකක් ලියන්න.

1. සියලු අවදානම් ඔප්පුව 2.පූර්ණ අලාභ ඔප්පුව 3. ඇගයු ඔප්පුව 4.විවෘත ඔප්පුව (ලකුණු 02 යි)

(ii) (අ) ව්‍යාපාර කටයුතු වල සාර්ථකත්වය සඳහා ප්‍රවාහනය සඵලදායිව යොදා ගැනීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන්න. (ලකුණු 02 යි)

(ආ) වර්තමාන ශ්‍රී ලංකාවේ බහුල වශයෙන් බහලු ගත නැව් භාවිතයට යොදා ගනි. මීට හේතු දක්වන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ව්‍යාපාර විසින් යොදා ගනු ලබන අභ්‍යන්තර හා බාහිර සන්නිවේදනය ව්‍යාපාරයකට වැදගත් වන්නේ කෙසේද යන්න පිළිබඳ කරුනු 2 බැගින් වෙන වෙනම දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) සංවිධානයක සාර්ථකත්වය සඳහා සඵලදායි සන්නිවේදනය බෙහෙවින් ඉවහල් වේ. සඵලදායි සන්නිවේදනයට විවිධ බාධා පවති. එසේ බලපාන බාධා 4 ක් නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) SAARC (සාර්ක්) සංවිධානය වෙළඳ කලාපයක් ලෙස සැලකෙන්නේ ඇයි? (ලකුණු 02 යි)

(ආ) BRICS වෙළඳ කලාපයක් ලෙස නොසැලකෙන්නේ ඇයි? (ලකුණු 02 යි)

(v) සුපිරි වෙළඳසැල් පාරිභෝගික ජනතාව අතර ජනප්‍රිය වීමට හේතු කවරේද? (ලකුණු 04 යි)

## II කොටස

(5) (i) (අ) කළමනාකරණය යන්න අර්ථ දක්වන්න (ලකුණු 01 යි)

(ආ) ආයතනයක අරමුණු සහ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යෙදවුම් මොනවාදැයි දක්වන්න. (ලකුණු 01 යි)

(ඉ) කළමනාකරණය ක්‍රියවලියකි. මෙම ක්‍රියාවලියට අයත් කාර්යන් පිලිවෙලින් නම්කර ඒවායින් ඉටුකරනු ලබන්නේ කුමක්දැයි කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) රොබට් එල් කර්ට්ස් විසින් කළමනාකරුවකු සතු විය යුතු කුසලතා ප්‍රධාන වර්ග 03 කට බෙදාවෙන්කර ඇත. එම කුසලතා නම්කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(ආ) කළමනාකරුවන්ගේ කුසලතා හා කළමනාකරුවන්ගේ මට්ටම් අතර සම්බන්ධතාවයක් පවති. එම සම්බන්ධතාවය කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 01 යි)

(iii)(අ) මෙහෙයුම් කළමනාකරනයේ මූලික කාර්යවන්නේ ඉහළ ගුණත්වයෙන් යුතු භාන්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරීමයි. නිෂ්පාදන කළමණාකරණයේදී මේ සඳහා අනුගමනය කරන විවිධ නිෂ්පාදන ක්‍රම නම්කර ඉන් එකක් උදාහරන සහිතව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) තොග පාලනය යනු කුමක්ද? තොග පිරිවැය පාලන ක්‍රමයක් ලෙස හදුන්වන JIT ක්‍රමය කෙටියෙන් විස්තර කරන්න.? (ලකුණු 02 යි)

(iv) (අ) නිෂ්පාදන ධාරිතාව යනු කුමක්දැයි හදුන්වන්න? ආයතනයකට අධි ධාරිතාව කෙසේ බලපෑම් ඇති කරන්නේද යන්න දක්වන්න? (ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදන පිරිවැයේ අඩංගුවන පිරිවැය වර්ග 2 නම් කරන්න එම පිරිවැය වර්ග 2 කෙටියෙන් පැහැදිලි කරන්න? (ලකුණු 02 යි)

(v) (අ) ව්‍යාපාරයක ප්‍රසස්ථ තොග මට්ටම තීරණය කරන ප්‍රධාන සාධක අතරින් එකක් ලෙස ආර්ථික ඇනවුම් ප්‍රමාණය දැක්විය හැක. ආර්ථික ඇනවුම් ප්‍රමාණය යනු කුමක්දැයි විස්තර කරන්න? (ලකුණු 02 යි)

(ආ) පහත සඳහන් කරුණු පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.
(1) තත්වකව (2) නැවත භාවිතයට ගැනිම හා ප්‍රතිචක්‍රිය කරණය (ලකුණු 02 යි)

(6) (i) (අ) නිෂ්පාදකයින් තම නිෂ්පාදිතවලට ප්‍රශස්ථ වෙළෙඳපොලක් ලබා ගැනිම සඳහා වෙළඳපොල ඛණ්ඩනය කරනු ලැබේ. වෙළඳපොළ ඛණ්ඩනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි දක්වන්න. (ලකුණු 01 යි)

(ආ) ඉලක්ක වෙළෙඳපොල යන්න පැහැදිලි කරන්න. (ලකුණු 01 යි)

(ඉ) නිෂ්පාදිතයන්ට සාර්ථක ඉල්ලුමක් ඇති වීමට හොඳ සන්නමක් තිබිය යුතුය. හොඳ සන්නමක පැවතිය යුතු ප්‍රධාන ගුණාංග මොනවාද? (ලකුණු 02 යි)

(ii)(අ) ඇසුරුම්කරණය යන්න කෙටියෙන් අර්ථ දක්වන්න. ඇසුරුම් කරණයෙන් පාරිභෝගිකයාට හා ව්‍යාපාරිකයාට අත්වන වාසි වෙන වෙනම දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) අලවිකරණ හර සංකල්ප 2 ක් වන වටිනාකම හා තෘප්තිය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iii)(අ) ප්‍රාග්ධන ලාභ සංකල්පය හදුන්වා උදාහරණයක් සපයන්න. (ලකුණු 02 යි)

(ආ) ඒකක භාරයක ආයෝජනය කිරීම ආයෝජන කළඹන ආයෝජනය කිරිමකි. මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iv)(අ) අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපල හා භාණ්ඩාගාර බිල්පත් වෙළඳපල කෙටියෙන් හදුන්වන්න (ලකුණු 02 යි)

(ආ) මූල්‍ය වෙළඳපල ගණුදෙනු වන අනෙකුත් සුරැකුම්පත් හා සැසදීමේදි භාණ්ඩාගාර බිල්පත් වල දැකිය හැකි සුවිශේෂි වාසි මොනවාද? (ලකුණු 02 යි)

(v) මූල්‍ය වෙළඳපල හදුන්වා එය මූල්‍ය උපකරණවල කල්පිරීමේ කාලය අනුව, මූල්‍ය උපකරණවල බිහිවීම අනුව හා මූල්‍ය උපකරණවල ස්භාවය අනුව වර්ග කර දක්වන්න. (ලකුණු 04 යි)

(7) (i) (අ) ණය මූල්‍යනය හා හිමිකරු මූල්‍යනය ව්‍යාපාරයක ආදායම කෙරෙහි ඇති කරන බලපෑම කෙබඳුද? (ලකුණු 02 යි)

(ආ) ද්‍රවශීලතා අනුපාත තුනක් දක්වා දල ලාභ ආන්තික අනුපාතිකය ගණනය කිරීම සඳහා වන සූත්‍රය දක්වන්න. (ලකුණු 02 යි)

(ii) ව්‍යාපාර සංවිධානයක කටයුතු කරන මානව සම්පත සේවා යෝජකයන් හා සේවාදායකයන් වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදනු ලැබේ .

(අ) සේවායෝජකයන් යනු කවුරුන්දැයි හඳුන්වා ඔවුන්ගේ ප්‍රධාන අරමුණ සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සේවාදායකයන් යනු කව්රුන්දැයි හඳුන්වා ඔවුන් ගේ ප්‍රධාන අරමුණ සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) සේවක දුක්ගැනවිලි සේවකයාගේ කාර්යක්ෂමතාවයට සෘජුවම බලපානු ලබයි. එම නිසා දුක්ගැනවිලි ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට බාධාකාරි විය හැකිය.

(අ) සේවක දුක්ගැනවිලි යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) සේවක දුක් ගැනවිලි නිවාරනයට ගතයුතු පියවර අනුපිළිවෙලින් දක්වන්න. (ලකුණු 02 යි)

(iv) තනතුරකට බඳවාගත් නව සේවකයකු සිය රැකියාව කරගෙන යාමේදි එය කොතෙක් දුරට සාර්ථකව ඉටුකරන්නේ දැයි සොයා බලා වාර්ථා කිරීමේ ක්‍රියාවලිය කාර්යඵල ඇගයීමයි.

(අ) කාර්‍යඵල ඇගයීමේ පරිපාලනමය අරමුණු දෙකක් හා සංවර්ධන අරමුණු දෙකක් වෙන වෙනම සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) පහත සඳහන් දෑ කෙටියෙන් පැහැදිලි කරන්න.

1. රැකියා විස්තරය 2. සේවක සුභසාධනය (ලකුණු 02 යි)

(v) වෘත්තීය සමිතියක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි හඳුන්වා සේවක වෘත්තීය සමිතියක අරමුණු 4 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(8) (i) පහත සඳහන් තොරතුරු පද්ධතිවලට අදාලව පිහිටුවා ගත හැකි තොරතුරු පද්ධති දෙක බැගින් ලියන්න.

(අ) අලෙවිකරණ තොරතුරු පද්ධති.

(ආ) මූල්‍ය හා ගිණුම්කරන තොරතුරු පද්ධති

(ඇ) මෙහෙයුම් තොරතුරු පද්ධති.

(ඉ) පර්යේෂණ හා සංවර්ධන තොරතුරු පද්ධති (ලකුණු 04 යි)

(ii) කෙටි සටහන් ලියන්න.

(අ) ලෝක ව්‍යාප්ත ජාලය (World Wide Web)

(ආ) විද්‍යුත් තැපැල(e-mail)

(ඇ) ප්‍රවෘත්ති කණ්ඩායම් (News Group)

(ඉ) ගොනු හුවමාරු නියමාවලිය(File TRANSFER Protocol ) (ලකුණු 04 යි)

(iii) (අ) හොඳ තොරතුරක පැවැතිය යුතු ගුණාංග කවරේද? (ලකුණු 02 යි)

(ආ) තොරතුරු පද්ධතියක කාර්යයන් නම් කරමින් හඳුන්වන්න. (ලකුණු 02 යි)

(iv) (අ) ලිඛිත ව්‍යාපාර සැලැස්මක ඇති වාසි කවරේද? (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාර සැලසුමක මෙහෙයුම් සැලැස්මේ අන්තර්ගත වන කරුණු මොනවාද? (ලකුණු 02 යි)

(v) (අ) ඔබගේ යහළුවන් සමග විවේකය විනෝදයෙන් මෙන්ම ආර්ථිකමය වශයෙන් වැදගත්වන ආකාරයට යොදාගත හැකි ව්‍යාපාර අදහසක් සඳහා දළ ව්‍යාපාර සැලැස්මක් ඉදිරිපත් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරයක ජීව දත්ත ලේඛණය ව්‍යාපාර සැලැස්මයි. ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේද? ඔබගේ පිළිතුරු පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)